# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 15
NUMBER 02

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

MAY 2012 මැයි මාසය (බුද්ධ වර්ෂ 2556 වෙසක් මාසය)

http://www.lankaheritage.com/lankaviththi/


## ඔබ සැමට සුබ වෙසඟක් වේවා !
## HAPPY VESAK TO ALL OUR READERS !



ඉපිද කිළිටි දියඹේ යට මඩ වගුරු
විහිද ඉහළ පිපෙමින් පානා රුසිරු
සුවඳ නෙළුම සේ යහපත් වන අයුරු
එපද උතුම් දෙසුවෝ ලොව වෙන කවුරු!

Being born in a dirty lake
sodden in muck and mud
But is able to spring up far above
with beauty unsullied
That's the sweet scented lotus,
giving the world a live example
Who else could have sermonised
such noble words that simple !

♦ *දයා ආනන්ද* ♦ *Daya Ananda Ranasinghe*

# ජාතියේ සතුරෝ N.G.O.

♦ **සංජය විමලරත්න විසිනි**

**එ**න් ජී ඕ **NGO** යන ඉංග්‍රීසි අකුරු තුන **Non Governmental Organisation** යන ඉංග්‍රීසි වචනයන්හි කෙටිකර දැක්වීම කි. ඒ වචනවල අර්ථය **රාජ්‍ය නොවන සංවිධානය** යනුයි.

රටක රජයක් විසින් එහි සංස්ථා සහ දෙපාර්තමේන්තු මගින් කරනු ලබන වැඩ සහ සේවා පිළිබඳව අපි දැන සිටිමු. ඒ දේවල් රජයක් කරන්නේ හුදෙක් රටේ සහ ජනතාවගේ යහපතට මිස ලාභ ලැබීමේ බලාපොරොත්තුවෙන් නොවේ. එසේම පුද්ගලික අංශයද එවැනි කාර්යයන්ට අත ගසා ජනතාවගේ එදිනෙදා අවශ්‍යතාවන් සඳහා සේවා සපයනු ලබන අතර එම සේවා සැපයීම වෙනුවෙන් ප්‍රතිලාභ ද ඔව්හු බලාපොරොත්තු වෙති, ලබති.

NGO යන යෙදුම කෙළින්ම භාවිතා නොකරන්නේ නමුදු අප රටෙහි කාලයක සිට පවත්වාගෙන යන ආගමික අධ්‍යාපනික හා සුවසේවා ආදී විවිධ සේවා සපයන පුද්ගලික සංවිධාන හා පුණ්‍යායතන බොහොමයක් වැටෙන්නේ මෙම **රා.නො.ස.** අංශයටය. උදාහරණයක් වශයෙන් පාසැල් රෝහල් අනාථ නිවාස ආදිය පවත්වා ගෙන යන මහාබෝධි සමාගම, ක්‍රිස්තියානි සංවිධාන, සැල්වේෂන් ආමි හෙවත් ගැලවීමේ හමුදාව ආදී සංවිධාන දැක්විය හැකි ය.

කලුතර බෝධි භාරකාර මණ්ඩලය විශාල පුණ්‍යාතනයකි. එසේම ජාත්‍යන්තර වශයෙන් ද ප්‍රසිද්ධියට පත්ව ඇති **Oxfam** සහ **Red Cross** (රතුකුරුස) ආදි සංවිධාන තවත් උදාහරණය. මෙම සියළු සංවිධානයන් හි සාමාජිකයන් සිය කැමැත්තෙන්ම මුදල් හා සේවය සංවිධානයේ පැවැත්ම සඳහා පරිත්‍යාග කර ඇත. ඔව්හු ඉන් ලාභ බලාපොරෝත්තු නොවෙති.

සාමාන්‍ය පිළිගත් මතයට අනුව නම් රාජ්‍ය නොවන සංවිධානවල පරමාර්ථය රටක රාජ්‍යයක ආර්ථික හා සාමාජයික සංවර්ධන සඳහා ස්වේච්ඡාවෙන් මුදල් සහ ශ්‍රමය යොදවා කරන මහඟු සේවයකි. එසේම එයින් ආපසු ලාභ ප්‍රයෝජන බලාපොරොත්තු නොවේ. තවද එම සංවිධාන රටේ රජයට කිසිදු ආකාරයකින් සම්බන්ධ නොවූ, එමෙන්ම ඊට බලපෑම් නොකරන නිදහස් ඒවා ය. අතීතයේ මෙම සංවිධාන මුලින්ම ඇරඹූ කාලයේ ඉහතකී සංකල්ප ඒ මුල් සංවිධාන විසින් ඉදිරියට ගෙනවුත් ක්‍රියාත්මක කරන ලද නමුත් ගතවූ දශක තුන හතරක කාලයක සිට එවැනි බොහෝ සංවිධාන මුළුමනින්ම ඒ අදහස් වලට පටහැනිව ලාභ සෙවීමම පරමාර්ථ කොටගත් දූෂිත මාර්ගයන් ඔස්සේ යන බව පැහැදිලි වන්නට වීය.

## පිරිහීම

සෝවියට් දේශයේ වැටීමත් සමග නැගණහිර යුරෝපයේ වූ ආර්ථික කඩාවැටීම හමුවේ ඇමරිකා එක්සත් ජනපදය විසින් මෙහෙයවනු ලැබූ බටහිර රටවල් කීපයක් සිවිල් සමාජ (civil society) පිහිටුවීමේ අළුත් සංකල්පයක් ගෙන ආහ. එහි මුඛ්‍ය අදහස වූයේ එතෙක් රටක රජයක් විසින් සිය රාජ්‍ය සංස්ථා හා දෙපාර්තමේන්තු මගින් සපයන ලද ආර්ථික හා සාමාජීය පහසුකම් බොහොමයක් ස්වේච්ඡාවෙන් ක්‍රියාත්මක වන පුද්ගලික සිවිල් සංවිධාන වලට පවරා ඒවා මගින් ක්‍රියාත්මක කරවීමෙන් රජය එතෙක් දැරූ බර සහ වියදම් අඩුකර ගැනීමය. එසේ පිහිට වූ සිවිල් සමාජ නම්කරනු ලැබූයේ රාජ්‍ය නොවන සංවිධාන හෙවත් **Non Governmental Organisation** යනුවෙනි. මෙම සංවිධාන රටේ සමාජ ආර්ථික හා දේශපාලනික හැම අංශයක් කරාම විහිදී ගිය අතර ඒවා සහ රාජ්‍ය සංවිධාන අතර වෙනසක් ඇති බවක් ජනතාවටද තේරුම් ගන්නට බැරි විය.

## රාජ්‍ය නොවන සංවිධාන වල මූල

ක්‍රමයෙන් මෙම රාජ්‍ය නොවන සංවිධාන ඕනෑම රටක ජන සමාජය තුළට කා වැදී බටහිර ගැති ධනවාදී බලවේගයන්ට අවශ්‍ය පරිදි එම ජන සමාජ හසුරුවන මෙවලමක් ආයුධයක් බවට පෙරළින. මේ කාල වකවානුව ගෝලීයකරණය සහ වෙළඳ පොළේ ආර්ථිකය ආදී නව සංකල්ප ලෝකයට එකතුවූ සමයයි. මෙහිදී ඇමරිකා එක්සත් ජනපදය ලොව සුපිරි බලවතා බවට පත්වූ අතර එහි මූලිකත්වය මත බටහිර ධනවාදය පදනම් කරගත් ආර්ථික හැඩගැස්මක් ලොව පුරා බොහෝ රටවල පැතිර යන්නට වූයේය. රාජ්‍ය නොවන සංවිධාන ( NGO) බොහෝ රටවල් තුළ වැදගත්කමක් ලබමින් වඩාත් ඉදිරියට විත් කැපී පෙනෙන්නට වූයේ මෙහිදී ය.

මෙම සිවිල් සමාජ ලවා ඕනෑම රටක ජන සමාජයක තමන්ට අවශ්‍ය කාර්යයන් ඉෂ්ඨ කරගැන්මට හැකි බව වටහාගත් බටහිර රටවල් වහ වහා සංවර්ධන වෙමින් පවතින තුන්වන ලෝකයේ රටවල රාජ්‍ය නොවන සංවිධාන බිහිවීමට අනුබල දුන්හ. ඊට අවශ්‍ය අරමුදල් විවිධ විදේශික ධනවාදී ආයතන මගින් නොමසුරුව සම්පාදනය කරනු ලැබිණ. ඒ අනුව එක්දහස් නවසිය අනූ ගණන්වල ශ්‍රී ලංකාව ඇතුළු තුන්වන ලෝකයේ රටවල් රාශියක NGO බිහිවන්නට වීය.

පිටරටින් ලැබෙන මුදල් ආධාර වලට වහවැටුණු අප රටේ විවිධ පුද්ගලයෝ විවිධ නම් හා පරමාර්ථ ඉදිරිපත් කරමින් NGO පිහිටුවා ගත්හ. කතාව අනුව නම් ඒ බොහෝ NGO සංවිධාන තමා පෙනී සිටින පරමාර්ථ වශයෙන් දක්වා ඇත්තේ සමාජ සේවය, සංවර්ධනය හා ග්‍රාමීය දිළිඳු ජනතාව නගා සිටුවීම ආදී යයි. එහෙත් එය එසේමද කියා සොයා බලන්නට කවුරුවත් නැත. ඇතැම් සංවිධානවලට පිටරට ආයතන මගින් මුදල් හා පහසු කම් සැපයුවද සැබැවින්ම යමක් සිදුවන්නේද කියාවත් ඒ මුදල් එවන අය දන්නේ නැත.

මේ සියල්ල මුල්වුණේ දූෂණයට ය. එම රැල්ලට රටේ විද්වතුන් සහ බුද්ධිමතුන්ද හසුවීම නිසා රටේ යහපතට යෙදවිය යුතු බුද්ධිමත් අදහස් නොලැබී ගියා පමණක් නොව එම බුද්ධිමතුන්ගේ සහභාගිත්වය නිසාම ඇතැම් කූට ව්‍යාපාර වලට ආවරණය ලැබී ඒවා යහපත් සංවිධාන ලෙසින් පෙනෙන්ට විය. මේ සියල්ලටම වඩා සිදුවූ අනිසි ප්‍රතිපලය නම් එම NGO ව්‍යාපාර තුළින් අප රටේ දේශපාලනයට විවිධ අන්දමේ බලපෑම් කරන්නට සහ අපේ අභ්‍යන්තර කටයුතු වලට ඇඟිලි ගසන්නට බටහිර ධනවාදී රටවලට හැකියාව ලැබීමය. එමෙන්ම අප රටට දැඩි හානි පැමිණ වූ ත්‍රස්තවාදි සතුරන්ට අවශ්‍යව තිබූ ආධාර සපයන්නටද ඔවුන් එම NGO යොදාගත් බව මනාව ඔප්පුවීය.

4 වන පිටුවට →




අප සැමගේ විශ්වාසය දිනූ

FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3